# සම්ප්‍රදායික දඩයම් ක්‍රම හා බැඳි ඇදහිලි සහ විශ්වාස පිළිබඳව අධ්‍යයනයක් (මැදගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අලුත්වෙල ග්‍රාමය ඇසුරින්)

කේ.එම්.එල්.එම්. පියදාස[1]

ප්‍රමුඛ පදඃ දඩයම් ක්‍රම, ඇදහිලි සහ විශ්වාස, ග්‍රාමීය, යන්ත්‍ර මන්ත්‍ර, සංස්කෘතිය

## හැඳින්වීම

ආදී මානවයාගේ මූලික අවශ්‍යතා සම්පූර්ණ කරගැනීමේ අරමුණින් දඩයම් රටාව ආරම්භ වූ නමුත් කාලයාගේ ඇවෑමෙන් මෙම ක්‍රියාවලිය විකාශනය වී වර්ධනය වීමේදී දඩයම් මගින් මුදුන් පමුණුවා ගැනීමට අවශ්‍ය වූ අරමුණු ද වර්ධනය විය. අතීතයේ දඩයම් යුගයේ පටන් විකාශය වෙමින් වර්ධනය වූ දඩයම අද වර්තමානය වන විටත් සුළු හෝ බහුල වශයෙන් එක් එක් ප්‍රදේශය තුළ පවතින බව හඳුනාගත හැකිය. මෙම සම්ප්‍රදායික දඩයම යන විෂය පථය තුළ හඳුනාගත හැකි එක් සුවශේෂී පැතිකඩක් ලෙස මේහා බැඳී පවතින ඇදහිලි සහ විශ්වාසයන් හඳුනාගත හැකිය. ඉතිහාසය දෙස බලනවිට ලාංකික ජනතාව තම ජීවිතයේ බොහෝ අවස්ථාවන්හීදී නොයෙක් ආකාරයේ ඇදහිලි හා විශ්වාසයන් කෙරෙහි විශ්වාසය තබා ඒ මත බැඳී පැවති බවත් වර්තමානයේදීත් යම්තාක් දුරට මෙම ඇතැම් ඇදහිලි හා විස්වාසයන් කෙරෙහි විස්වාසයෙන් පසු වන බවත් හඳුනාගත හැකිය. මොනරාගල දිස්ත්‍රික්කයේ මැදගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කොටබෝව වසමට අයත් ග්‍රාමීය ප්‍රදේශයක් වන අලුත්වෙල ග්‍රාමය ආරම්භයේ සිටම ගම්වාසීන් දඩයම් කිරීමට යොමු වී සිටියහ. මෙකී ප්‍රදේශය ආශ්‍රය කොට ගනිමින් මෙම සම්ප්‍රදායික දඩයම් ක්‍රම හා බැඳී පවතින්නා වූ ඇදහිලි සහ විශ්වාසයන් කෙබඳුද යන ගැටලුව මෙම පර්යේෂණය හරහා අධ්‍යනය කරනු ලබයි. මෙම පර්යේෂණයේ අරමුණු වූයේ ග්‍රාමීය ජනයා තුළ තිබූනා වූ සම්ප්‍රදායික දඩයම් හා බැඳි පැවති ඇදහිළි සහ විශ්වාස පිළිබඳව කරුණු අනාවරණය කරගැනීමයි. මෙම පර්යේෂණය මගින් මෙකී ඇදහිලි හා විශ්වාස පිළිබඳව, ඒ සම්බන්ද සිරිත් විරිත් (පුද පූජා පවත්වන ආකාරය) පිළිබඳව, ජනශ්‍රැති පිළිබඳව, ගැමි සංස්කෘතිය පිළිබඳව, ගැමියාගේ ආකල්ප සහ අත්දැකීම් පිළිබඳව මෙන්ම මෙම ඇදහිලි සහ විශ්වාසයන් පිළිබඳව වර්තමාන තත්ත්වය පිළිබඳව තොරතුරු අනාවරණය කරගැනීමට උත්සාහ කරනු ලැබේ. මෙය ලාංකික සංස්කෘතියේ තවත් එක් පැතිකඩක් ඉස්මතු කිරීමට වැදගත් වේ.

[1] ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය
lakshikamadumalim@gmail.com

**පර්යේෂණ ක්‍රමවේදය**

මෙම පර්යේෂණය සඳහා ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යොදාගනු ලැබිණි. එහිදී ප්‍රාථමික දත්ත ක්ෂේත්‍ර අධ්‍යනය හරහා සම්මුඛ සාකච්ඡා මගින් රැස් කරගන්නා ලදී. මේ යටතෙ ප්‍රධාන වශයෙන් හේන් ගොවිතැන ප්‍රධාන ජීවනෝපාය බවට පත් කරගත් ග්‍රාමීය ප්‍රදේශයක් ආශ්‍රිතව ක්ෂේත්‍ර අධ්‍යනය සිදු කරනු ලැබිණි. පුස්තකාල විමර්ශන හරහා ද්විතීක දත්ත ලබා ගැනීමේ දී විෂය සම්බන්ද ග්‍රන්ථ, පර්යේෂණ ලිපි, වාර්තා, ජනප්‍රවාද සංග්‍රහ යනාදිය පරිශීලනය සිදු විණි. මේහිදි මේ අයුරින් එකතු කරන ලද සමස්ත දත්ත විශ්ලේෂණය සඳහ තේමා විශ්ලේෂණය යොදා ගනු ලැබීය.

**ප්‍රතිඵල සහ සාකච්ඡාව**

තම ජීවිතයේ සෑම කාර්යයක් පිළිබඳවම ඇදහිලි සහ විශ්වාසයන්ගේ එල්බගෙන කටයුතු කිරීම ගම්වාසීන් අතර සුලභ ලක්ෂණයක් විය. දඩයම් කිරීමේ දී ද මෙකී ගැමියන් අතර තරයේ පිළිගනු ලබන විශ්වාසයන් කිහිපයක් තිබූ බවට හඳුනා ගත හැකිය. ඇතුළත් සහ පිටත් යන වේලාවන් පිළිබඳව තරයේ විශ්වාස කරන ගම්වාසීන් ඇතුළත් වේලාවන් මෙම කාර්යයන් සඳහා යොදා ගනු ලබන අතර එම වේලාවන්වල දඩයම් කිරීමෙන් තමාගේ කාර්යය සාර්ථක වන බවට විශ්වාසයක් ගම්වාසීන් තුළ විය. දඩයම් කිරීමේදී ඇතැම් සතුන් දඩයම් නොකිරීමට ද ගැමියන් වග බලා ගත් අතර ඒ සඳහා ද ඔවුන් තුළ පැවති විශ්වාසයන් බලපෑ බව හඳුන ගත හැකි විය. එහිදි කතරගම දෙවියන්ගේ වාහනය ලෙස සලකන මොනරා නම් පක්ෂියා දඩයම් කිරීම තුළින් තමාට ද හිරිහැරයක් වන බව ගැමියන්ගේ විශ්වාසය විය. දඩයම් කරුවන් තම දක්ෂතාවයට වඩා වැඩි විශ්වාසයක් යන්ත්‍ර මන්ත්‍ර ශාස්ත්‍රය පිළිබඳව දක්වා තිබූ බවද හඳුනාගත හැකිය. වෙඩි වැරැද්දවීමට, දඩයම් කල සත්ත්වයන් සොය ගැනීමට නොහැකි වන ආකාරයට සහ දඩයම් කිරීමේ දී සතුන් තමා අසල සිටියත් නොපෙනන ආකාරයට සිදු කිරීමට මන්ත්‍ර වලින් හැකියාව තිබූ බව හඳුනා ගත හැකිය.දඩයම් කල අවස්තාවේ දී දඩයම් කල ස්ථානයේදීම පළමු මාංශ කොටස දඩයමට උපකාර කරන දෙවියන්ට පූජා කිරීම දැකිය හැකිය. ජනශ්‍රැති වලට අනුව 'තනි පොළේ දෙවිය' (තනි පොලේ යකා) දඩයම් සඳහා උපකාර කරන දෙවි කෙනෙක් පිළිබඳව හඳුනාගත හැකි විය. මෙය දඩයම් කරන්නන් අතර ජනප්‍රිය ඇදහිල්ලක් විය. පරම්පරාගතව පැමිණි දැනුම සහ භක්තිය,ක්‍රෝදය වැනි ගැමියන්ගේ ආකල්ප පිළිබඳව හඳුන ගත හැකි අතර තමා සමඟ ආරෝවක් ඇති පුද්ගලයින්ගෙන් පලි ගැනීම සඳහ දඩයම් කිරීමේ දී යන්ත්‍ර මන්ත්‍ර භාවිත කොට තිබේ. නමුත් වර්තමානය තුළදී විවිධ හේතූන් මත සම්ප්‍රදායික දඩයමෙන් දුරස් වීමත් සමඟ මෙම ඇදහිලි සහ විශ්වාසයන් ද ක්‍රම ක්‍රමයෙන් ගැමි සමාජයෙන් දුරස් වී තිබේ. එයට හේතු ලෙස කාර්මීකරණය සහ නව තාක්ෂණය සමඟ වත්මන් පරපුරේ මෙම ඇදහිලි සහ විශ්වාසයන් පිළිබඳව අවදානය යොමු කිරීම ඉතාමත් විරළය. මේ පිළිබඳව දැනුම, අත්දැකීම් සහ විස්වාසය තිබූ පරම්පරාවේ බොහෝ දෙනෙක්

වර්තමානය වන විට මියගොස් තිබීම නිසා මෙම ඇදහිලි සහ විශ්වාසයන් ද ක්‍රම ක්‍රමයෙන් යටපත් වී ගොස් ඇති බව හඳුනාගත හැකිය. වර්තමාන පරම්පරාව මේ පිලිබඳව ඉතා අඩු සැලකිල්ලක් දක්වන බව මෙම පර්යේෂණ හරහා තහවුරු විය.

**සමාලෝචනය**

විවිද අරමුණු අරඹයා දඩයම් කිරීම සිදු වූ නමුත් ක්‍රම ක්‍රමයෙන් දඩයම යන්න සමාජයෙන් බැහැර කරන්නා වූ සංකල්පයක් වීම නිසාවෙන් අලුත් පරම්පරාව තුළ දඩයම් පිලිබඳව මෙන්ම ඒ හා බැඳි පැවති අනෙකුත් සංකල්පයන් පිළිබඳව ද දැනුමක් නොතිබෙනා අතර එම සංකල්පයන් අභාවයට ගොස් තිබේ. එමෙන්ම වර්තමානයේ මෙම යන්ත්‍ර මන්ත්‍ර ශාස්ත්‍රය පිළිබඳව බොහෝ පිරිසක් තුළ කිසිඳු විශ්වාසයක් නොමැති අතර මේවා ව්‍යාජ අදහස් බව ඇතැමුන්ගේ මතය වේ. කෙසේ නමුත් මෙවැනි චාරිත්‍ර වාරිත්‍ර පිළිබඳව ඇති දැනුම ගැමි සංස්කෘතියෙන් වියැකී යාම අවසනාවන්ත තත්ත්වයකි. එයින් අපගේ දේශීයත්වයට ආවේණික වූ සංස්කෘතිකාංගයක් සමාජයෙන් බැහැරව වියැකී යාම සිදු වෙමින් පවති.භාවිතයට නොගැනුනා නමුත් මේ ජන විඤ්ඤාණයෙන් වියැකී යන්නා නමුත් ලාංකික සමාජය තුළ වටිනා වූත් වැදගත් වූත් ක්ෂේත්‍රයක් ලෙස හඳුනාගත හැකිය.

**ආශ්‍රිත මුලාශ්‍රය**

උඩවත්ත, පියදාස. (2007). ***වැදි ජන ගොතග*** කොළඹ: ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ.

ගුණවර්ධන, ප්‍රියශාන්ත. (2004). ***පුරාණ ගම***. ජාඇල: සමන්ති පොත් ප්‍රකාශකයෝ.

පොඩි අප්පුහාමි, කේ.බී. (2007). ***දඩයම් විදි***. කොළඹ: ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ.